මාධ්‍ය භාවිතාව තුළ ආචාර ධාර්මික භාවයත්, සහකම්පනයත් පැවතිය යුතු බව, මාධ්‍ය ආචාර ධර්ම විෂයෙහිදී සඳහන් වේ. මේ හැරෙන්නට, සිය පාසල් සමය අනවශ්‍ය අතපෙවීම් වලින් තොරව සම්පූර්ණ කරගැනීමට බාලවයස්කරුවන්ට නිදහස තිබිය යුතු බව ද, මාධ්‍ය ආචාර ධර්ම තුළ වැඩිදුරටත් දැක්වේ.

"ඇළේ මිනියක් පා වෙනවා කිව්වාට එය අම්මාගේ කියා හිතුවේ නෑ" යන සිරස්තලය යටතේ දිනමිණ පුවත්පතේ පළ වී තිබූ පුවත් වාර්තාව (සැප්. 26, 2022), ඉහත කියූ සහකම්පනයෙන් යුතු වාර්තාකරණය හා මාධ්‍ය සදාචාරය පිළිබඳව මාධ්‍යවේදීන් කෙතරම් සංවේදී දැයි පරීක්ෂාවට ලක් කෙරෙන අවස්ථාවක් ලෙසින් දැක්විය හැක. එම පුවත් වාර්තාවේ එම මියගොස් ඇති අයගේ 16 හැවිරිදි දියණියගේ නම පළ වී ඇත. එසේම, ඇගේ මවගේ දේහය සොයාගත් අවස්ථාව, ඇගේ පියා මත්ද්‍රව්‍ය භාවිතා කරන බව ඇතුළු ඇගේ ජීවිතය සම්බන්ධ සංවේදී තොරතුරු ද පුවත් වාර්තාවේ වැඩිදුරටත් විස්තරාත්මකව දැක්වී ඇත.

1) ඔබ සිතන ලෙසට, මෙම පුවත් වාර්තාව ඔස්සේ, මාධ්‍යවේදීන් තුළ තිබිය යුතු සහකම්පනය පිළිබිඹු වේ යැයි ඔබ සිතන්නේ ද?

2) මෙම 16 හැවිරිදි දැරියගේ ජීවිතය සම්බන්ධ අඳුරු තොරතුරු සියල්ල සාක්කි ලෙසින් හෝ පුවත් වාර්තාවේ සඳහන් කිරීමත්, එසේම ඇයගේ අනන්‍යතාවය හෙළිදරව් කිරීමත් ඔස්සේ, ඇගේ පාසල් අධ්‍යාපනයට බාධාවක් නොපැමිණෙනු ඇතැයි සහතික විය හැකි ද?

මූලාශ්‍ර:

https://ethics.journalism.wisc.edu/.../practicing.../
https://www.editorscode.org.uk/the_code.php
https://www.afp.com/.../12_april_2016_afp_ethic_final.pdf